සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

08 S I

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016
## Third Term Test - Grade 13 - 2016

විභාග අංකය .............................  **කෘෂි විද්‍යාව I**  කාලය පැය දෙකයි

උපදෙස්

- ♦ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ♦ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- ♦ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

**1.** කුරුඳු බෝගය සඳහා පර්යේෂණ පවත්වන ආයතනය පිහිටා ඇත්තේ,
1. අම්බලන්තොට  2. කඹුරුපිටිය  3. බණ්ඩාරවෙල
4. උඩවලව  5. අගුණකොලපැලැස්ස

**2.** බෝග වගාකරන ලද ක්ෂේත්‍රයක ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාව ගණනය කිරීම සඳහා අවශ්‍ය දත්ත වනුයේ,
1. පසේ පවතින තෙතමන ප්‍රමාණයයි.
2. පසේ ක්ෂේත්‍ර ධාරිතාවය , ස්ථිර මැලවීමේ සංගුණකය සහ මූල මණ්ඩල කලාප ගැඹුරයි.
3. පසේ ක්ෂේත්‍ර ධාරිතාවය පසේ දෘශ්‍ය ඝනත්වය හා මූල මණ්ඩල කලාප ගැඹුරයි.
4. පසේ පවතින තෙතමන ප්‍රමාණය , ක්ෂේත්‍ර ධාරිතාවය , මූල මණ්ඩල කලාප ගැඹුර සහ පසේ දෘශ්‍ය ඝනත්වයයි.
5. පසේ පවතින තෙතමනය , ක්ෂේත්‍ර ධාරිතාවය සහ ස්ථිර මැලවීමේ සංගුණකයයි.

**3.** අඩු PH අගයක් ඇති තෙත් කලාපීය පසක බහුල වශයෙන් දැකිය හැකි ගැටලු වනුයේ,
1. යකඩ සහ ඇලුමිනියම් විෂතාවය සහ පොස්පරස් හිඟතාවයයි.
2. යකඩ ,ඇලුමිනියම් සහ සෝඩියම් විෂතාවයයි.
3. යකඩ , මැග්නීසියම් විෂතාවය සහ පොස්පරස් හිඟතාවයයි.
4. යකඩ , පොස්පරස් සහ ඇලුමිනියම් විෂතාවයයි.
5. ඉහත සඳහන් සියල්ලම වේ.

**4.** ප්‍රභාසංස්ලේෂණය සඳහා වැදගත්වන දෘෂ්‍ය ආලෝකයේ වර්ණ වනුයේ,
1. ඉන්ඩිගෝ - නිල් ය.  2. කොළ සහ කහ  3. කහ ,තැඹිලි
4. දම් - රතුය .  5. නිල් සහ රතුය.

5. ශ්‍රී ලංකාවේ වී වගා කිරීම සඳහා වඩාත් යෝග්‍ය පස් වර්ගය වනුයේ
1. රතු දුඹුරු පසය.  2. රෙගොසෝල් පසය.  3. දියළු පසය.
4. රතු ලැටසෝල් පසය.  5. රතු කහ පොඩ්සොලික් පසය.

6.

| රතු ආලෝකය අවශෝෂණය කරන ෆයිටක්‍රෝම් P 660 | රතු ආලෝකය → | ඈත රතු ආලෝකය අවශෝෂණය කරන ෆයිටක්‍රෝම් P 730 |
|---|---|---|

ඉහත දැක්වෙන ෆයිටක්‍රෝම් පරිවර්තනය සිදුවීම මගින්

1. කෙටි දින ශාකවල පුෂ්ප හටගැනීම උත්තේජනය වේ.
2. දිගු දින ශාකවල පුෂ්ප හටගැනීම උත්තේජනය වේ.
3. උදාසීන ශාකවල පුෂ්ප හටගැනීම උත්තේජනය වේ.
4. දිගු දින ශාකවල ඵල හටගැනීම උත්තේජනය වේ.
5. කෙටි දින ශාකවල ඵල හටගැනීම උත්තේජනය වේ.

7. ජලය එසවීම සඳහා භාවිතා කරනු ලබන කේන්ද්‍ර අපසාරී පොම්පයක් සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ස්වයං පූර්ණ සහ නොවන වශයෙන් පොම්ප වර්ග දෙකක් ඇති අතර ස්වයං පූර්ණ පොම්පවල පාද කපාටයක් නොමැත.

B - ජලය පොම්ප කිරීමේදී සාමාන්‍යයෙන් චූෂණ හිස මීටර් 6කට සීමාවූවත් විසර්ජන හිස සීමාවක් නොමැතිව ජලය සැපයිය හැකිය.

C - ජලය පිට කිරීම ඒකාකාරීව හා නොකඩවා සිදුවේ.

ඉහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වනුයේ,

1. C පමණි. 2. A පමණි. 3. B පමණි. 4. A හා C පමණි. 5. A, B හා C යන සියල්ලම වේ.

- පහත දක්වා ඇති එළදෙනකගේ ප්‍රජනක පද්ධතිය ආශ්‍රයෙන් 8 හා 9 ප්‍රශ්න සඳහා පිළිතුරු පසයන්න.




8. A ලෙස සඳහන් කර ඇති ව්‍යුහය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ
    1. මෙම ව්‍යුහය තුල නිපදවන්නේ මද ලක්ෂණ ඇති කිරීමට වැදගත් වන හෝමෝන පමණි.
    2. මෙම ව්‍යුහය තුල FSH හෝමෝනය ශ්‍රාවය වීම සිදුවේ.
    3. A ව්‍යුහය තුල පවතින ඩිම්බයක් සෑම දින 28 කට වරක්ම මෝචනය වීම සිදුවේ.
    4. A ව්‍යුහය තුලින් ඩිම්බ මෝචනය වීමෙන් පසු පසු මදය ආරම්භ වීම සිදුවේ.
    5. මෙම ව්‍යුහය මගින් ශ්‍රාවය වන ඔක්සිටොසින් ගර්භණීභාවය පවත්වා ගෙන යාමට උපකාරී වේ.

9. Eලෙස දක්වා ඇති ව්‍යුහය
    1. කලල අධිරෝපණය සඳහා වැදගත්වේ.
    2. ප්‍රොජෙස්ටරෝන් හෝමෝනය නිපදවීමට උපකාරී වේ.
    3. ගර්භාෂය තුලට විෂ බීජ ඇතුළු වීම වැලැක්වීමට උපකාරී වේ.
    4. ස්වභාවික පට්ටි දැමීමකදී ශුක්‍රාණු තැම්පත් කිරීමට උපකාරී වේ.
    5. පීතදේහය නිපදවීමට උපකාරී වේ.

10. වියළි කලාපීය සෝයාබෝංචි වගා කර ඇති ක්ෂේත්‍රයක ජල සම්පාදනය කිරීමට පෙර ඇති ජල ප්‍රතිශතය 15% වන අතර මූල මණ්ඩල කලාප ගැඹුර 60cm විය . පසේ විශිෂ්ඨ ගුරුත්වය 1.5 විය . පාංශු ජල ප්‍රතිශතය ජල උසක් ලෙස සෙන්ටිමීටර් වලින් කොපමණද?

**1. 0.135 2. 1.35 3. 135 4. 1350 5. 13.5**

11. නයිට්‍රීකරණ ක්‍රියාවලියේදී සිදුවන පියවර පහත දැක්වේ.

කාබනික නයිට්‍රජන් —A→ $NH_4^+$ —B→ $NO_2^-$ —C→ $NO_3^-$

මෙහි **A , B, C** ලෙස පිළිවෙලින් නම් කර ඇත්තේ
1. ඇසටොබැක්ටර් , නයිට්‍රොසොමනාස් , නයිට්‍රොබැක්ටර්
2. නයිට්‍රොසොමනාස් , නයිට්‍රොබැක්ටර් , ක්ලොස්ට්‍රීඩියම්
3. ඇසටොබැක්ටර්, නයිට්‍රොබැක්ටර්, නයිට්‍රොසොමනාස්
4. නයිට්‍රොබැක්ටර්, ඇසටොබැක්ටර් , ක්ලොස්ට්‍රීඩියම්
5. නයිට්‍රොසොමනාස් , ඇසටොබැක්ටර්, නයිට්‍රොබැක්ටර්

12. ශාක තුල ගිබරලික් අම්ලයේ ප්‍රධාන කාර්යය වනුයේ
**1.** පාර්ශ්වික අංකුර වර්ධනය යටපත් කිරීමයි. 2. ඵල ඉදීම වර්ධනය කිරීමයි.
**3.** පත්‍ර පතනය ප්‍රවර්ධනය කිරීමයි. 4. කඳ හා අන්තර් පර්ව දික්වීම වැඩි කිරීමයි.
**5.** අග්‍රස්ථ අංකුරයේ වර්ධනය යටපත් කිරීමයි.

13. ආන්තික උපයෝගීතාවය හා මුළු උපයෝගීතාව අතර සම්බන්ධතාව වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ, මුළු උපයෝගීතාව වැඩිවන විට ආන්තික උපයෝගීතාව
1. නියත වේගයකින් වැඩිවන ලෙසය. **2.** ක්‍රමයෙන් අඩුවන ලෙසය.
3. වැඩිවන වේගයකින් වැඩිවන ලෙසය. **4.** ඒකීය වේගයකින් වැඩිවන ලෙසය.
**5.** පළමුව වැඩි වී පසුව අඩුවන ලෙසය.

14. ශිෂ්‍යයෙක් විසින් ඔහුට ලැබුණු A සහ B පස් සාම්පල වල වයනය රෝල් ක්‍රමය භාවිතයෙන් සෙවීමේදී ලැබුණු රෝලේ සහ මුදුවේ හැඩයන් පහත දැක්වේ.

| පස් සාම්පලය | රෝලේ ආකාරය | මුදුවේ ආකාරය |
|---|---|---|
| A |  |  |
| B |  |  |

A හා B පස් සාම්පලවල වයනය වනුයේ
1. A මැටි පසක් වන අතර B වැලි පසකි. **2.** A මැටි පසක් වන අතර B ලෝම පසකි.
3. A වැලි පසක් වන අතර B මැටි පසකි. 4. A සහ B පස් සාම්පල දෙකම මැටි පස් වේ.
5. A ලෝම පසක් වන අතර B මැටි පසකි.

**15.** අධෝභෞම ප්‍රරෝහනය සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත සඳහන්වේ.
A - ඒකබීජ පත්‍රී බීජ අධෝභෞම ප්‍රරෝහනය පෙන්වයි.
B - බීජ ප්‍රරෝහනයේදී බීජයේ බීජෝපරිය බීජාධරයට වඩා වේගයෙන් වර්ධනය වේ.
C - බීජ ප්‍රරෝහනයෙන් පසු සමහර බීජවල බීජ පත්‍ර ප්‍රභාසංස්ලේෂණය කරයි.
ඉහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ
1. A පමණි. 2. B පමණි. 3. A හා B පමණි. 4. C පමණි. 5. A B C යන සියල්ලම

**16.** ආග්නේය පාෂාණ සෑදෙනුයේ
**1.** මැග්මා ඝනවීමෙනි 2. ලාවා සහ මැටි ඛනිජ එක්වීමෙනි.
**3.** අවසාදිත පාෂාණ විපරීත වීමෙනි 4. අවසාධිත හා විපරීත පාෂාණ ජීර්ණයෙනි
**5.** විපරීත පාෂාණ ඒකාබද්ධ වීමෙනි

**17.** කෘත්‍රිම බිත්තර රක්කවීම සම්බන්ධයෙන් <u>නිවැරදි</u> ප්‍රකාශය වන්නේ

A - තෝරා ගන්නා බිත්තරයේ බර ග්‍රෑම් **55 - 58** අතරවීම

B - ඉන්කියුබේටරය තුළ **80% -85%** ක ආර්ද්‍රතාවයක් පවත්වා ගෙන යාම

C - ඉන්කියුබේටරය තුළ බිත්තර තැබීමේදී බිත්තරයේ මොට කෙළවර පහතට සිටින පරිදි තැබීම

D - බිත්තර දිනකට **5-6** වරක් හැරවීම සිදු කිරීම

මින් නිවැරදි පිළිතුර වන්නේ

1. A හා B  2. A හා D  3. A හා C  4. A C හා D  5. A B හා D

**18.** පටක රෝපණයේදී පටකයෙන් අපට අවශ්‍ය ආකාරයට අංගෝපාංග වර්ධනය කර ගැනීම සඳහා වර්ධක යාමක වශයෙන් ඔක්සින සහ සයිටොකයිනින් යොදා ගැනීම වැදගත් වේ. අංකුර වර්ධනය සඳහා

1. ඔක්සීන් සහ සයිටොකයිනින් **1** ට වැඩි අනුපාතයක් යෙදිය යුතුය.
2. ඔක්සීන් සහ සයිටොකයිනින් සමාන ප්‍රමාණවලින් යෙදිය යුතුය.
3. සයිටොකයිනින් පමණක් යෙදිය යුතුය
4. ඔක්සීන් පමණක් යෙදිය යුතුය.
5. ඔක්සීන් සහ සයිටොකයිනින් **1** ට අඩු අනුපාතයක් යෙදිය යුතුය

**19.** පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේදී භාවිතා කරනු ලබන තාවකාලික ප්‍රචාරක ව්‍යුහයක් <u>නොවන්නේ</u>

**1.** සරල ප්‍රචාරක ව්‍යුහ  **2.** ජල සංරක්ෂක ව්‍යුහ  **3.** උණුසුම් පාත්ති

**4.** ලැත් නිවාස  **5.** තනිපැළ ආවරණ

**20.** එක්තරා ගෝත්‍රයක කෘමීන් සම්පූර්ණ රූපාන්තරණයක් දක්වන අතර පටලමය පියාපත් යුගල දෙකක් ඇතත් පියැඹීමේදී ඒවා තනි ව්‍යුහයක් ලෙස ක්‍රියා කරයි. උදරයේ සිහින් වූ වෘන්තයක් ඇත. මෙම ගෝත්‍රය වනුයේ,

1. Lepidoptera  2. Coleoptera  3. Hymenoptera  4. Orthoptera  5. Diptera

**21.** වෛරස් රෝග වාහකයන් ලෙස ක්‍රියාකරන කෘමීන් වනුයේ ,

1. ගොයම් මකුණා , පළතුරු මැස්සා ,කීඩෑවා
2. කීඩෑවා , පැළ මැක්කා, සුදු මැස්සා
3. අවුලකපෝරා කුරුමිණියා , පොල් කුරුමිණියා , එපිලැක්නා කුරුමිණියා
4. කොළකන දළඹුවා , බෝංචි මැස්සා , පස් මුළු මකුණා
5. කොපු පනුවා , ගොඩවෙල්ලා , කෙසෙල් ගුල්ලා

**22.** වී වගාවට පමණක් යොදාගන්නා පස් භාවිත නොකරන තවාන් වර්ගයකට උදාහරණයක් වනුයේ

**1.** ඩැපොක් තවාන  2. මඩ තවාන  3. ගිල් වූ තවාන

4. නොරිදෝකෝ තවාන 5. සුසංහිත තවාන

**23.** වාර්ෂික වල්පැළෑටි පාලනය සඳහා වඩාත් ඵලදායී කළමණාකරන මූලධර්මය වන්නේ ,

1. ඒවා පුෂ්පීකරණයට පෙර විනාශ කිරීම
2. සියල්ල නසන වල් නාශකයක් යොදා ගැනීම
3. වල්පැල කපා පිලිස්සීම
4. තවාන් පාත්තිවලින් සියලු වල්පැල බීජ ඉවත් කිරිම
5. ක්ෂේත්‍රයට ජෛව විද්‍යාත්මක වල්පැල පාලන කාරක හඳුන්වාදීමය.

**24.** බිත්තරයක මේදය බහුල ලෙස අඩංගු වන්නේ ,

**1.** සුදු මදයේ සහ කහ මදයේය.  2. තුනී සහ ඝන සුදු මදයේය.

**3.** කහ මදයේය.  **4.** ඝන සුදු මදයේ සහ කහ මදයේය.

**5.** කහ මදයේ සහ කවච පටලවලය.

25. කෙඳි සහිත ආහාර පරිභෝජනය හා සම්බන්ධ ප්‍රකාශ දෙකක් පහත දක්වා ඇත.
A-.කෙඳි බහුල ආහාර වේලක් පුද්ගලයකුගේ රුධිර සීනි මට්ටම පාලනය කිරීමට උපකාරි වේ.
B-කෙඳි බහුල ආහාර පරිභෝජනය මිනිසාගේ දේහයේ ඛණිජ අවශෝෂණය කෙරෙහි බලපෑ හැකිය .
ඉහත ප්‍රකාශ
1. A නිවැරදියි.
2. B නිවැරදියි.
3. A නිවැරදි වන අතර එය B මගින් තවදුරටත් පැහැදිලි කරයි.
4. A හා B දෙකම නිවැරදියි
5. B නිවැරදි වන අතර එය A මගින් තවදුරටත් පැහැදිලි කරයි.

26. හේන් ගොවිතැන සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A- මූලික වශයෙන් පවුලේ ශ්‍රමය භාවිතා කරයි.
B- මිශ්‍ර බෝග වගා රටාවක් දක්නට ලැබේ.
C- නිරිත දිග මෝසම් වර්ෂාවෙන් උපරිම ලෙස ප්‍රයෝජන ලබමින් වියළි කලාපයේ බහුලව ක්‍රියාත්මක කරයි.
D පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කරයි
ඉහත ප්‍රකාශ අතරින් <u>නිවැරදි</u> වන්නේ
1. A හා C පමණි. 2. A හා D පමණි. 3. A,C හා D පමණි. 4. A, B හා D පමණි. 5. A හා B පමණි.

27. පහත සඳහන් ඕර්ගනෝ ක්ලෝරීන් අතුරින් දීර්ඝතම අර්ධ ජීව කාලයක් වාර්තා වී ඇත්තේ ,
1. DDT වලය . 2. ඇල්ඩ්‍රින් (Aldrin) වලය. 3. ක්ලෝරොඩේන් වලය.(chlorodane)
4. එන්ඩ්‍රින් (Endrine)වලය. 5. ඔක්සික්ලෝරොඩේන් (Oxychlorodane)වලය.

28. ශාක අභිජනනය මගින් බහුගුණක ශාක බිහි කිරිමේදී ත්‍රිගුණ ශාක (3n) වල ලක්ෂණයක් <u>නොවන්නේ</u> ,
1. වර්ණ දේහ කට්ටල තුනක් පැවතීමයි.
2. නිපදවන ඵල වල විශාලත්වය වැඩිය.
3. බීජ රහිත ඵල නිපදවීමට හැකියාවක් ඇත.
4. මේවාට ජන්මානු නිපදවා බීජ නිපදවීමේ හැකියාවක් ඇත.
5. ද්වීගුණ ශාකයක ජන්මානුවක් හා චතුර්ගුණක ශාකයක ජන්මානුවක් එක් වීමෙන් ත්‍රිගුණක ශාක සෑදේ.

29. රසායනිකව බීජ ජීව්‍යතාවය සෙවීම සඳහා භාවිතා කරනු ලබන ටෙට්‍රා සෝලියම් ක්ලෝරයිඩ් ද්‍රවණය ජීව්‍ය කලල රතු වර්ණයට හරවනු ලබන්නේ කලලය මගින් නිපදවන
1. $K^+$ මගින් 2. $H^+$ මගින් 3. $Ca^{2+}$ මගින් 4. $Na^+$ මගින් 5. $CO_2$ මගින්

30. පසු අස්වනු හානි අඩු කිරීම සඳහා පලතුරු හා එළවළු ගබඩා කළ යුත්තේ,
1. අඩු ආර්ද්‍රතාව හා ඉහළ උෂ්ණත්ව යටතේය. 2. අඩු ආර්ද්‍රතාව හා පහළ උෂ්ණත්ව යටතේය.
3. වැඩි ආර්ද්‍රතාව හා පහළ උෂ්ණත්ව යටතේය. 4. වැඩි ආර්ද්‍රතාව හා ඉහළ උෂ්ණත්ව යටතේය.
5. වැඩි ආර්ද්‍රතාව හා කාමර උෂ්ණත්ව යටතේය.

- ගවයාගේ සංකීර්ණ ආමාශයේ රූපසටහන ඇසුරින් 31, 32, 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




31. ප්‍රෝටීන් ජීර්ණය වීම සඳහා පෙප්සින් ස්‍රාවය වීම සිදුවන්නේ
1. A ව්‍යුහය මගිනි. 2. B ව්‍යුහය මගිනි. 3. C ව්‍යුහය මගිනි. 4. E ව්‍යුහය මගිනි. 5. D ව්‍යුහය මගිනි.

32. A ව්‍යුහය සම්බන්ධයෙන් <u>නිවැරදි</u> ප්‍රකාශය වන්නේ
1. අභ්‍යන්තර බිත්තිය මී වදයක සෛලවල ස්වරූපයක් ගනියි.
2. ව්‍යුහය තුළ වාෂ්පශීලී මේද අම්ල හා නයිට්‍රජන් වායුව නිපදවීමක් සිදුවේ.
3. ගවයාගේ ජීර්ණ එන්සයිම මගින් ආහාර ජීර්ණය කිරීමට වැදගත්වේ.
4. අභ්‍යන්තර බිත්තිය වූල් තුවායක ස්වරූපයක් ගනියි.
5 සංකීර්ණ ආමාශයේ කුටීර අතරින් විශාලත්වයෙන් දෙවන ස්ථානය ගනියි.

33. C ව්‍යුහය තුළ සිදුවන කාර්යයට සමාන කාර්යයක් ඉටු කරන කුකුළාගේ ආහාර මාර්ග පද්ධතියේ කොටස වන්නේ ,
1. ගොජුරයි. 2. වටනයයි 3. ක්ෂුද්‍රාන්තයයි 4. බහුනැමියයි 5. විතංශිකාවයි

- පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන වල් පැළෑටි කිහිපයකි. ඒ ඇසුරින් 34 හා 35 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. Echinochloa crus – galli
B. Fimbristylis miliacea
C. Cyperus rotundus
D. Mimosa pigra
E. Achyranthes aspera

34. ඉහත වල්පැළෑටි අතුරින් ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටියක් වන්නේ ,
1. A ය. 2. B ය. 3. D ය. 4. C ය. 5. E ය.

35. මෙම වල්පැළෑටි අතුරින් වාර්ෂික පන් වර්ග වනුයේ,
1. B හා C 2. A හා B 3. B හා D 4. A හා E 5. C හා E

36. දෙමුහුම් අභිජනනයෙන් නිපදවන දෙමුහුම් බීජ සම්බන්ධව නිවැරදි පිළිතුර වන්නේ,
1. දෙමුහුමට ලක්වූ මාපියන්ගේ $F_2$ පරම්පරාවයි.
2. $F_1$ පරම්පරාවට වඩා $F_2$ පරම්පරාවේ ලක්ෂණ දියුණු මට්ටමක පවතී.
3. මේවායේ දෙමුහුම් දිරියක් ඇත.
4. $F_1$ පරම්පරාව 100% දෙමාපිය ලක්ෂණ දරයි.
5. දෙමුහුම් දිරිය සහභිජනනයේදී ක්‍රමයෙන් වැඩි දියුණු වේ.

37. ශාක පරාගනය හා සංසේචනයේදී ස්වඅසංගතිය යනු
1. යම් ශාකයක පරාග එම ශාකයේම කලංකය මත තැම්පත් වුවත් ඒවා ප්‍රරෝහනය නොවීමයි.
2. යම් ශාකයක පරාග එම ශාකයේම කලංකය මත තැම්පත් වී ප්‍රරෝහනය වුවත් පරාග නලය කීලය දිගේ වර්ධනය නොවීම.
3. යම් ශාකයක පරාග එම ශාකයේම කලංක මත තැම්පත් නොවීම
4. යම් ශාකයක පරාග එම ශාකයේම කලංකය මත පතිත වී පරාග ප්‍රරෝහනය වී පරාග නලය කීලය දිගේ වර්ධනය වුවත් ඩිම්භ සංසේචනය නොවීම
5. ශාකයක පුෂ්පයක පරාග එම පුෂ්පයේම කලංකයට ග්‍රාහී නොවීම

38. කෙටි කාලීන නිමැවුම සමග විචලතා නිරීක්ෂණය කල හැක්කේ
1. කෙටිකාලීන වියදම් වලය. 2. ආන්තික වියදම් වලය. 3. ප්‍රාග්ධන වියදම් වලය
4. විචල්‍ය වියදම් වලය 5. ස්ථාවර වියදම්වලය

**39.** පිරිවැය වක්‍ර සම්බන්ධතාවය වඩාත් හොඳින් විස්තර කල හැක්කේ

1. සාමාන්‍ය පිරිවැය වක්‍රය ආන්තික පිරිවැය වක්‍රය හමුවන්නේ ආන්තික පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයේදීය.
2. සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය ස්ථාවර පිරිවැය වක්‍රය හමුවන්නේ ස්ථාවර පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයේදීය .
3. සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හමුවන්නේ සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයේ දීය.
4. සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හමුවන්නේ සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයේදීය.
5. ආන්තික පිරිවැය වක්‍රය සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හමුවන්නේ සාමාන්‍ය මුළු පරිවැය වක්‍රයේ අවම ලක්ෂයේදීය.

**40.** බිම් සකස් කිරීමෙන් පසු පසේ සිදුවන වෙනස්කම් කිහිපයකි.

1. අහඹු රළු බව වැඩි වේ දෘශ්‍ය ඝනත්වය වැඩිවේ. සච්ඡිද්‍රතාවය වැඩිවේ.
2. ජල සන්නායකතාවය වැඩිවේ. සංතෘප්ත ජල ප්‍රතිශතය වැඩිවේ දෘශ්‍ය ඝනත්වය වැඩිවේ
3. අහඹු රළු බව අඩු වේ. දෘශ්‍ය ඝනත්වය අඩුවේ පසේ ජල කාන්දුව වැඩිවේ
4. අහඹු රළු බව වැඩිවේ. සච්ඡිද්‍රතාවය වැඩිවීමත් සමග දෘශ්‍ය ඝනත්වය ද වැඩි වේ
5. අහුඹු රළු බව වැඩිවේ. දෘශ්‍ය ඝනත්වය අඩු වේ පසේ ජල කාන්දුව වැඩි වේ

**41.** බිම් සකස් කිරීමේ උපකරණ කිහිපයක් පහත දැක්වේ.ඒවා යොදාගන්නා බිම් සැකසීමේ අවස්ථා අනුපිළිවෙලින්

තැටි නගුල , මෝල්බෝඩ් නගුල , රිජරය , ජපන් වල්පැල නෙලනය

1. ප්‍රාථමික බිම් සැකසීම, ද්විතීයික බිම් සැකසීම, පාත්ති සැකසීම, ද්විතීයික බිම් සැකසීම
2. ප්‍රාථමික බිම් සැකසීම, ප්‍රාථමික බිම් සැකසීම , පාත්ති සැකසීම , පශ්චාත් බිම් සැකසීම
3. ප්‍රාථමික බිම් සැකසීම, ප්‍රාථමික බිම් සැකසීම, ද්විතීයික බිම් සැකසීම, ද්විතීයික බිම් සැකසීම
4. ප්‍රාථමික බිම් සැකසීම, ද්විතීයික බිම් සැකසීම, පාත්ති සැකසීම, පශ්චාත් බිම් සැකසීම
5. ප්‍රාථමික බිම් සැකසීම, ප්‍රාථමික බිම් සැකසීම, පාත්ති සැකසීම, පාත්ති සැකසීම

**42.** පහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

A -ශාක වර්ධන අවධියේදී පොහොර යෙදීම මතුපිට පොහොර යෙදීම ලෙස හඳුන්වයි.

B -කාබනික හා රසායනික පොහොර එකට යෙදීම ඒකාබද්ධ ශාක පෝෂණ ක්‍රියාවලිය නම් වේ.

C -රසායනික හා කාබනික පොහොර වෙන වෙනම යෙදීමේදී පොහොර භාවිතා කාර්යක්ෂමතාවය වැඩි වේ.

D -රසායනික පොහොර වල වැඩි පෝෂණ සාන්ද්‍රණයක් ඇත.

1. A හා B පමණි. 2. B හා C පමණි 3. A,B හා D පමණි 4. A හා C පමණි 5. A,B හා C පමණි.

**43.** පොහොර මිශ්‍රණයක පොහොර ශ්‍රේණිය 27-13-6 වේ.

1. 27% නයිට්‍රජන් ද 13% පොස්පරස් ද 6% පොටෑසියම් ද වේ.
2. 13% රොක්පොස්පේට් ද 27% යූරියා ද 6% මියුරියේට් ඔෆ් පොටෑෂ් ද අඩංගු වේ.
3. 27% N ද 13% $P_2O_5$ ද 6% $K_2O$ ද අඩංගු වේ .
4. 27% යූරියාද 13 % රොක්පොස්පේට් ද 6% මියුරේට් ඔෆ් පොටෑස් ද අඩංගු වේ.
5. 27% යූරියා ද 6% රොක්පොස්පේට් ද 13 % මියුරේට් ඔෆ් පොටෑස් ද අඩංගු වේ.

**44.** කිරි වලට සාපේක්ෂව මුල් කිරි වල

1. වැඩිපුර ඝනද්‍රව්‍ය ,වැඩිපුර ලැක්ටෝස් සහ වැඩිපුර පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
2. වැඩිපුර ඝනද්‍රව්‍ය ,වැඩිපුර ප්‍රෝටීන් සහ වැඩිපුර පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
3. අඩු ඝන ද්‍රව්‍ය, වැඩිපුර ප්‍රෝටීන් සහ අඩු පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
4. අඩු ඝන ද්‍රව්‍ය ,අඩු ප්‍රෝටීන් සහ අඩු පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
5. අඩු ඝන ද්‍රව්‍ය, අඩු ප්‍රෝටීන් සහ වැඩිපුර පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.

45. රනිල ශාකවල නයිට්‍රජන් තිර කිරීම හා පරිවෘත්තියට අවශ්‍ය ක්ෂුද්‍ර මූල ද්‍රව්‍යය වන්නේ,
1. Fe 2. Cu 3. Zn 4. Mo 5. B

46. පාංශු ස්කන්ධයක් මත යම් බලයක් ඇති කර එම බලය ක්‍රමයෙන් වැඩි කිරීමේදී එය පුපුරා යාමට විරුද්ධව පස් කැටය දක්වන ප්‍රතිරෝධීතාව හඳුන්වන්නේ,
1. පාංශු ඝනත්වයයි. 2. පාංශු සංස්ථිතියයි. 3. පාංශු සච්ඡිද්‍රතාවයයි.
4. පාංශු රෙගොලිතයයි. 5. පාංශු ප්‍රතික්‍රියාවයි.

47. උපේක්ෂා වක්‍ර වල ලක්ෂණයක් නොවන්නේ ,
1. මෙහිදී පහළ උපේක්ෂා වක්‍රයක ලක්ෂයකට සාපේක්ෂව ඉහළ උපේක්ෂා වක්‍රයක ලක්ෂයකින් වැඩි තෘප්තියක් ලැබේ.
2. උපේක්ෂා වක්‍ර ඉහළ සිට පහලට බෑවුම් වේ . එය සෘණ බෑවුමක් සහිතයි .
3. උපේක්ෂා වක්‍ර මූල ලක්ෂයට උත්තල වේ.
4. එක් උපේක්ෂා වක්‍රයක් තවත් උපේක්ෂා වක්‍රයක් හරහා නොයයි.
5. උපේකෂා වක්‍රයක් දිගේ ඉහළ සිට පහලට යනවිට තෘප්ති මට්ටම් අඩුවීමක් සිදුවේ.

48. එක්තරා ගොවිපලක වී නිෂ්පාදනය හා ඒ සඳහා පොහොර හා ශ්‍රමය භාවිතය අතර සම්බන්ධතාවය (යෙදවුම් යෙදවුම් සම්බන්ධතාවය ) පහත දක්වා ඇත.




එම නිෂ්පාදන වක්‍රය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වනුයේ
1. එම නිෂ්පාදන වක්‍රයේ බෑවුම ඒකාකාරීවීමයි.
2. එම නිෂ්පාදන වක්‍රයේ ඉහල කොටසේදී වැඩි ලාභ ලැබීමයි.
3. එම නිෂ්පාදන වක්‍රය ඔස්සේ ස්ථාවර නිෂ්පාදනයක් පෙන්නුම් කිරීමයි.
4. එම නිෂ්පාදන වක්‍රයේ පහල කොටසේදී වැඩි ලාභ ලැබීමයි.
5. සාධක සංයෝජනවල තාක්ෂණික සීමා ලබාදීමයි.

49. ශිෂ්‍යයකු ආහාර ගැනීමෙන් පසු අතුරුපසක් ලෙස කෙසෙල් ගෙඩි ආහාරයට ගැනීම සිදුවිය. එමගින් ඔහුගේ ආහාරයට සපයනු ලබන්නේ,
1. මේද , කාබෝහයිඩ්‍රේට් හා තන්තු වේ. 2. විටමින් , ප්‍රෝටීන හා තන්තු වේ.
3. විටමින් , ප්‍රෝටීන හා ඛනිජ වේ. 4. විටමින් , කාබෝහයිඩ්‍රේට් හා ඛනිජ වේ.
5. ජලය , ප්‍රෝටීන හා තන්තු වේ.

50. දේහ ස්කන්ධ දර්ශකය අනුව පුද්ගලයකුගේ පෝෂණ තත්ත්වය ඇගයීමට හැකිය . අධිබර ලෙස සලකනු ලබන පුද්ගලයකු වඩාත් හොඳින් නිරූපනය කරන BMI අගය
1. 18.5 අඩුය. 2. 18.5 -24.9 අතර වේ. 3. 30-39.9 අතර වේ.
4. 40 හෝ ඊට වැඩිය. 5. 25-29.9 අතර වේ